Set
A 1

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11**
**First Term Test 2017** | **Grade 11**

**සිංහල භාෂාව හා සාහිත්‍යය I**
**சிங்களமொழியும் இலக்கியமும் I**
**Sinhala Language And Literature I**

**පැය එකයි**
**ஒரு மணித்தியாலயம**
*One Hour*

සැලකිය යුතුයි:
(i) සියලුම ප්‍රශ්නවලට උත්තර ලියන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ජනතා ප්‍රශ්න **හමස් පෙට්ටියේ ලා** කටයුතු කිරීම දේශපාලඥයන්ගේ පුරුද්දයි.
   (1) ප්‍රශ්න පෙට්ටියක් සැකසීම. (2) ප්‍රශ්නවලට පිළිතුරු නොදීම
   (3) ප්‍රශ්නවලට විසඳුම් නොදී කල් දැමීම (4) ප්‍රශ්න හම් පෙට්ටියකට දැමීම

2. ඇතැම් කුඨ වෙළෙන්දෝ දරුවන් **ගොනාට අන්දවති.**
   (1) ගොනෙක් ඇඳ දීම (2) රැවටීම
   (3) ගොන් වැඩ කිරීම (4) නරකකට පෙළඹවීම

3. නව ප්‍රතිපත්ති පිළිබඳ ජනතාවට ඇත්තේ **හුඹස් බියකි.**
   (1) අස්ථාන බියකි. (2) නියත බියකි. (3) සාධාරණ බියකි. (4) ප්‍රමුඛ බියකි.

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. විදේශිකයන්ගේ නිරන්තර ................................ රටේ ප්‍රශ්න අවුල් කිරීමට හේතු වෙයි.
   (1) සහචාරය (2) දුරාචාරය (3) ආචාරය (4) සංචාරය

5. මුලින් ම කළ යුත්තේ නව ව්‍යවස්ථාව පිළිබඳ ජනතාවගේ වැරදි ............................ දුරු කිරීමයි.
   (1) ආකල්පය (2) විකල්පය (3) සංකල්පය (4) භද්‍ර කල්පය

6. නිර්මාණකරණයේ දී සාහිත්‍ය කරුවාගේ ...................................... ඉතා වැදගත් වන්නකි.
   (1) ප්‍රකල්පනය (2) විකල්පනය (3) පරිකල්පනය (4) උපකල්පනය

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
   (1) අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව
   (2) අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය
   (3) ලෝවැඩ සඟරාව, සුභාෂිතය, සිරිත්මල්දම, ලෝකෝපකාරය
   (4) කෝකිල, ගිරා, සැළලිහිණි, හංස

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළය තෝරන්න.
   (1) පුස්ථකාලය, අභිරහස, නාමලේඛනය, කාර්යාලය
   (2) විශිෂ්ට, ශිෂ්ටාචාරය, කොට්ඨාසය, ආභාසය
   (3) සමස්ත, වාර්ථාව, අන්‍යෝන්‍ය, ව්‍යාකූල
   (4) ආභරණ, විවරන, සියලු, නිරාවරණය

9. එක් එක් වචනවල මූලකුරෙහි **පාපිල්ල, ඇලපිල්ල, දීර්ඝ ඉස්පිල්ල** සහ **ඇදය** පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) රුවල, වාරණ, සීතල, වැද්දා (2) සුළු, දූවිලි, වීර, කැළය
(3) පූසා, පාර, පීල්ල, හැන්ද (4) කුරාණය, පැහැය, සීගිරිය, රුවන්

10. 'කම්මල' යන පදය අයත් වන්නේ
(1) ආගම සන්ධියට ය. (2) පූර්ව රූප සන්ධියට ය,
(3) ස්වර සන්ධියට ය. (4) පර රූප සන්ධියට ය.

11. ''උක්ත පද'' දෙකක් සහ ''අනුක්ත පද'' දෙකක් සහිත වරණය තෝරන්න.
(1) නරියෙක්, ඇතමෙක්, ගිරවෙක්, දුවක් (2) නැයකු, පොළගෙක්, මිතුරෙක්, ළමයි
(3) දැරියක්, මිනිසෙකු, පාළකයෙක්, කම්කරුවන් (4) හාවෝ, ඉබ්බෝ, දරුවෝ, කෙල්ලක්

12. ''සාම්ප්‍රදායික'' යන පදයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කළ විට නිවැරදි ව දැක්වෙන්නේ,
(1) සාම්ප්‍රදාය + ඉක (2) සම්ප්‍රදාය + ඉක (3) සම්ප්‍රදා + යික (4) සාම්ප්‍රදා + ඉක

13. ''දරුවෝ සෙල්ලම් කරති'' යන වාක්‍යයෙහි, ''දරුවෝ'' යන්න
(1) උක්ත කර්තෘ ය. (2) අනුක්ත කර්තෘ ය. (3) උක්ත කර්මය ය. (4) අනුක්ත කර්මය ය.

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු** අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. ටී.බී.ජයා මහතා **අප්‍රතිහත ධෛර්යයෙන්** යුතුව තම ඉලක්කයන් කරා ගමන් කළ අයෙකි.
(1) නොපසුබස්නා උත්සාහයෙන් (2) අප්‍රකට දිරියෙන් (3) ආවේගශීලීව (4) නිර්ලෝභීව

15. නීතිඥයා තම **සේවාදායකයා** වෙනුවෙන් නඩුවට ඉදිරිපත් විය.
(1) සේවාව සපයන්නා (2) සේවාව නිර්දේශ කරන්නා
(3) සේවාව ලබාගන්නා (4) සේවාව ස්ථිර කරන්නා

16. මානවයා සතු සන්නිවේදන **ශක්‍යතාව** විශ්මිත වූවකි.
(1) නිපුණතාව (2) හැකියාව (3) ප්‍රවීණත්වය (4) ක්‍රමවේදය

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) සමුච්චයාර්ථවාචී නිපාත - ද,ත්,යි
(2) උපමාවාචී නිපාත - මෙන්, සේ, එව්
(3) ශීඝ්‍රාර්ථයෙහි නිපාත - වහා, විලස, යුහුව
(4) ශ්‍රැති ශ්‍රවනාර්ථයෙහි නිපාත - ලු, ල

18. දී ඇති පද පේළි අතරින් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයක් සමග බැඳී නොපවත්නා පද පේළිය තොරන්න.
(1) පැන, පැන්සල, ගල්කුර, පින්සල (2) අල්මාරිය, ඇඳ, පුටුව, මේසය
(3) අස්වැන්න, පොල්පලා, බිංකොහොඹ, කටුවැල්බටු (4) නගුල, පෝරුව, බෝලත්ත, දැතිගොයියාව

19. එක් එක් පේළිවල යෙදී ඇති පද යුගලවල **සමානාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරන්න.
(1) වඳුරා - කපි, රශ්මිය - කිරණ, රවුම් - වක්‍රාකාර, පිපීම - පුලින
(2) ළමා - පැටි, සතුට - ප්‍රමෝදය, ඉක්මන් - සෙද, පියයුරු - පයෝදර
(3) කුඩය - ඡත්‍රය, සංග්‍රාමය - යුද්ධය, මහත - විසල්, පිළිම -අනුරූ
(4) වලාකුළ - ගනකුළ, දෙක - බාන, නරියා - සිඟාලයා, මෘදු - ස්නිග්ධ

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය වන්නේ,
(1) පාපිෂ්ඨ - ධර්මිෂ්ඨ (2) නවක - ආධුනික
(3) විෂාද - ආහ්ලාද (4) මුක්තිය - බන්ධනය

21. ''කලංක'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) කැළල (2) මිනුම් විශේෂයක් (3) බෙහෙත් වර්ගයක් (4) වෘක්ෂයක්

22. කාලාර්ථයෙහි අසම්භාව්‍ය ක්‍රියාවක් ඇතුළත් වරණය වන්නේ,
(1) වෛද්‍යවරයා සේවිකාව ලවා බෙහෙත් ලියවයි.
(2) හොඳින් පාඩම් කළහොත් විභාගය සමත් විය හැකි ය.
(3) අක්කා උදෙන් ම නැගිට කෑම කා කඩේට ගියා ය.
(4) සතර දිගින් හිරු උදාවත පද්මයෝ විකසිත වූහ.

23. වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) හල් අකුරකට මුලින් යෙදෙන 'ර්' වෙනුවට රේඵය යෙදේ.
(2) ර'යන්නට පසුව යංශය සාමාන්‍යයෙන් යෙදේ.
(3) හල් අකුරකට පසුව යෙදෙන 'ර්' වෙනුවට රකාරාංශය යෙදේ.
(4) කොම්බුව සහ ගයනුකිත්ත යෙදෙන්නේ 'ඖ' ස්වරය වෙනුවටය.

24. ස්වර සන්ධිය නිවැරදි ව යෙදී ඇති තැනකට උදාහරණය වන්නේ,
(1) ගංවතුර (2) දකුණත (3) ඔවුනොවුන් (4) ගුරුතුමා

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන රජතුමාගේ නම නිවැරදි ව ඇතුළත් වරණය තෝරන්න.
(1) භුජබාටිය (2) වනෙබාහුබුක (3) ණුරටුමුගැදු (4) යසූර්ලවිධමරිට

- අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. තම තමන්ගේ වාසියට කවුරුත් එකතු වීම.
(1) කඩිරුල මැද්දට උණු අළු දැම්මා වගේ.
(2) දී කිරට බළල්ලුත් සාක්කිලු.
(3) ඉස්සල්ලා ආපු කණට වඩා පස්සේ ආපු අඟ ලොකු වුණා වගේ.
(4) ජරමර අස්සේ බරකරත්තලු.

27. ගැළපෙන ම දෙන්නකේ එකට එක්වීම.
(1) මගෙ මැණිකේ මට මානෙල් මලක් වගේ. (2) කපුරු මලේ සුවඳට බඹරුත් මැරෙනවලු
(3) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ. (4) එපා වාහෙට හොඳි බෙදන්නා වගේ.

28. පහත (අ),(ආ) කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සෑදී ඇති සංඛ්‍යා වඩාත් විවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A තුදුස | E 19 |
| B සොළොස | F 16 |
| C තෙළෙස | G 14 |
| D එකුන් විස්ස | H 13 |

(1) AE (2) DF (3) BG (4) CH

- අංක 29,30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) දරුවන් විභාගය සමත් වනු ඇත. (2)අපි මේ ප්‍රශ්නය විසඳති'යි කිසිවෙක් නොසිතුහ.
(3) වැඩිහිටියෝ ආදර්ශවත් ව හැසිරිය යුතු ය. (4) සිංහලයන් බෞද්ධයන් වෙති.

30. (1) සභා තොමෝ සතුටින් විසිර යති. (2) සියොත් කැළ ගී ගයා ඇය සනසවයි.
(3) දුදනෝ සුදනන් මෙන් හැසිරෙති. (4) දරුවෝ අනාගත පුරවැසියෝ ය.

31. A අම්මා ......................තාත්තා මා බැලීමට පැමිණෙයි.
B මව දරුවන් ..................... ගමට ගියාය.
C අසිත ...................... කාලදේවල නමගිය තවුසෙකි.
D වෙදැදුරා රෝගය සුවකරනු ...................... පිළියම් යෙදීය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළවෙළ කුමක් ද?
E වස් F නොහොත් G කැටුව H හෙවත්

(1) EFGH (2) GFHE (3) FGHE (4) FHGE

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ කුමක්ද?
**''මම ගෙදර ගියාම අම්මා ගොඩක් සතුටු වුණා.''**
(1) මා ගෙදර ගිය කල්හි මෑණියෝ බෙහෙවින් සතුටු වූහ.
(2) මම ගෙදර ගිය විට මෑණියෝ බෙහෙවින් සතුටු විය.
(3) මා ගෙදර ගිය කල්හි මෑණියන් බෙහෙවින් සතුටු වූහ.
(4) මම නිවසට වන් කළ අම්මා උදක් ම ප්‍රීතියට පත් වූහ.

33. එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද නාට්‍යයක් නොවන්නේ,
(1) කදාවළලු (2) පබාවතී (3) මනමේ (4) හුණුවටය

34. උපමාවක් රහිත කවි පදය තෝරන්න.
(1) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දි දී
(2) විදෙන ලෙලන නරු බර පුළුලුකුළ රැඳී
(3) ලෙල අත් කුසුම් පොඩි ගිනි සිළු සැළෙන වැනී
(4) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා.

35. 'එකිනෙහි ස්ත්‍රියක් පුතු බුදුන් හා ඇතු මැදට දමා කෝවේයකට වැද ගියාය' යන්නෙහි කෝවේයකට යනු,
(1) කෝපයයි. (2) කුඩා වීදියයි (3) දුම් පිට කිරීමයි. (4) කුඩ වේ තුඹසයි.

36. පහත කවියේ දී ඇති වරණ අතුරෙන් හතර වැනි පදය තෝරන්න.
රෑ තිස්පැයේ තනියම නිදි මරන්නේ.
පාන්දරට යන්තම් ඇස පියෙන්නේ
හේනේ කඩුල්ලට එපිටින් සිටින්නේ.
..............................................................................

(1) එගොඩ ගොඩේ උල ලේනා අඬන්නේ (2) මෙගොඩ ගොඩේ මම සීපද කියන්නේ
(3) නෑනා ඇවිත් සිහිනෙන් අත වනන්නේ (4) දෙගොඩ ගොඩේ කෙහෙදෝ නුඹ සිටින්නේ.

37. ඇති මුත් මිණ අබරණ - දිනුමුත් සම්පත් අපමණ
වුවහොත් රජ නපුරු - රූදු වග වලසුන් විලසේ
මෙම ගීත ඛණ්ඩය ඇතුළත් කෘතිය වන්නේ,

(1) හුණු වටයේ කතාව (2) වෙස්සන්තර නාට්‍යය (3) සිංහබාහු නාට්‍යය (4) මනමේ නාට්‍යය

38. ''හීන් අත්තා'' යනුවෙන් හඳුන්වන්නේ?
(1) සීයා ය (2) ආච්චී ය (3) පොඩි සීයාය (4) පොඩි මාමා ය

39. පහත කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.
වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු පැන
මහත් ගැඹුරු සිඳු නොයනෙව් වෙරළ පැන
ලදත් මෙමුළු දඹදිව රජසිරි සුදන
සිරිත් ලෙසට පවතී උඩඟු නොව මින

(1) නොයෙකුත් ගං,ඔය,ඇළ දොළවල ජලය ගලා අවුත් සාගරයේ තැන්පත් වන්නා සේ සත්පුරුෂයා මේ මුළු ජම්බුද්වීපයෙහි රාජ්‍ය ශ්‍රීය ලැබුණත් අහංකාර නොවේ.
(2) නොයෙක් ගං, ඔය, ඇළදොළවල ජලය ගලා ආවත් මහත් ගැඹුරු සයුර වෙරළ ඉක්මවා යන්නා සේ සත් පුරුෂයා ජම්බුද්වීපයේ රාජ්‍යත්වය ලැබුණත් අහංකාර නොවේ.
(3) වනාන්තරයේ ගං,ඔය, ඇළදොළවත් ගලා ආවත් මහත් ගැඹුරු සයුර වෙරළ තෙක් යන්නා සේ සත්පුරුෂ ජනයා ජම්බුද්වීපයෙහි රාජ්‍ය බලය ලැබුනත් සිරිත් පරිදී ජීවත් වේ.
(4) නොයෙක් ගං, ඔය ඇළදොළවල ජලය ගලා ආවත් සයුර වෙරළ ඉක්මවා නොයන්නාක් මෙන් සත් පුරුෂයා මේ මුළු ජම්බුද්වීපයෙහි රාජ්‍ය ශ්‍රීය ලැබුණත් අහංකාර නොවී සිරිත් පරිදී ජීවත් වේ.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.
'' රටක් දියුණු කිරීමට එහි වැසියන් නිසි ඉගෙනීම ද බුද්ධිමත් බව හා නිරෝගී බව ද ලැබූ අය විය යුතු ය.''

(1) නියම ඉගෙනීමත් බුද්ධියත් නිරෝගී භාවයත් තිබීම රටක දියුණුවට හේතු වේ.
(2) උගත්කම, බුද්ධිය හා නීරෝගී කම නොමැතිනම් රටක් දියුණු නොවේ.
(3) රටක් දියුණුවීමට නම් එරට වැසියන්ගේ උගත්කම, බුද්ධිය හා නිරෝගීභාවය තිබීම සෑහේ.
(4) රටවැසියන්ගේ උගත්කම, බුද්ධිය හා නීරෝගීකම රටක දියුණුවට ඉවහල් වේ.

Set
A 2

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
## Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **පළමු වාර පරීක්ෂණය 2018** | **11 ශ්‍රේණිය** |
| **இரண்டாம் தவணைப் பரீட்சை 2018** | **தரம் 11** |
| **First Term Test 2018** | **Grade 11** |

| | |
|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය II** | **පැය දෙකයි** |
| **சிங்களமொழியும் இலக்கியமும் II** | **மூன்று மணித்தியாலம்** |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි

1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් ඔබ අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් වචන දෙකෙහි අරුත් පැහැදිලි වන සේ වෙන වෙන ම වාක්‍ය දෙකක් ලියන්න.
(අ) පැළ (ආ) පැල

ii. පහත වැකියේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
'මෙවර විභාගයෙන් ඔහු ලැබූ විශිෂ්ට ප්‍රථිපලය පළාතේ වාර්ථාගත වූවකි.'

iii. පහත සඳහන් පද විසන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
(අ) දෑඟිලි (ආ) වල්ලූරා

iv. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාතයක් හා උපසර්ගයක් උපුටා දක්වන්න.
''මෙවර ඡන්දයෙන් ප්‍රසිද්ධ නායකයෝ රැසක් දරුණු ලෙස පරාජයට පත්වූහ.''

v. පහත සඳහන් පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙනම ලියන්න.
'තළින් තළම **පුල්** පියුමු'පුල **පඬෙරුය**'

vi. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) නොකැඩී එක දිගට ම පවතින්නා වූ (ආ) මුළු රැයක් පුරා පවතින

vii. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරයන් සඳහා පොදු ව්‍යවහාරයේ භාවිත වන වචන ලියන්න.
(අ) ගහමව්වා (ආ) දොරං

viii. පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම් නිදොස් කර නැවත ලියන්න.
(අ) ඔවුහු තරගය දිනනු ඇත. (ආ) රථ පෙළ මහමග ඉදිරියට ඇදෙති.

ix. පහත දැක්වෙන වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) සිරිදාස ගොනා කරත්තයෙන් **ලිහා** කණුවෙහි බැන්දේ ය.
(ආ) මෙතනින් වමට **හැරෙන්න.**

x. පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.
(අ) පළමු ත්‍යාගය (ආ) උද්‍යාන බිම

(ලකුණු 2 x10 =20)

2) පහත සඳහන් අ, ආ, ඉ, ඊ විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාවේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය දිනෙන් දින ම ඉහළ යමින් පවතී. මහා මාර්ග පද්ධතියේ අඩුපාඩු මෙන් ම රියදුරන්ගේ සහ පදිකයන්ගේ නොසැලකිලිමත් බව රිය අනතුරු බහුල වීමට බලපාන ප්‍රධාන හේතු සාධක වශයෙන් හඳුනාගෙන තිබේ. දැඩි නීතිරීති මෙන් ම රියදුරන්ගේ හා පදිකයන්ගේ කැපවීම ද රිය අනතුරු වළක්වා ගැනීම සඳහා බෙහෙවින් ම වැදගත් වේ.

(ආ)ජන කවිය, ජනකතා, ජන නාට්‍ය ආදී සාහිත්‍යාංග කතා උරුමයක් ලෙස විග්‍රහ කළ හැකි ය. ඉන් රටේ සාමාජික, සංස්කෘතික හා දේශපාලනික තොරතුරු ද නිරූපණය වේ. පුද්ගලයා තුළ යහපත් ආකල්ප වර්ධනය සඳහා සාහිත්‍යය පාදක වෙයි. ඒ අනුව රටේ ජනතා සිතුම් පැතුම් යහ මගට පත් කර සාමකාමී පුරවැසි පිරිසක් බිහි කර ගැනීමට සාහිත්‍ය ඉවහල් කර ගත හැකි ය.

(ඉ) ජල හිඟය, නාය යෑම් ගංවතුර. ලැව් ගිනි ආදිය ඇති වීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ ස්වභාවධර්මයට වඩා මිනිස් කටයුතු ය. මිනිසුන් ආත්මාර්ථය සඳහා ම මිස පොදු යහපත ගැන නො සලකන්නේ ඇයි? මේ විනාශකාරී කටයුතු මැඩ පැවැත්වීම නො කළහොත් අප කරා මහා විනාශයක් ළඟා වනු ඇත. එය වැළැක්වීම සඳහා දිගු කාලීන මෙන් ම කෙටි කාලීන වැඩ පිළිවෙලක් අවශ්‍ය වේ.

(ඊ) පාසල් ගොඩනැගිලි, ලීබඩු, විද්‍යා උපකරණ, පුස්තකාල පහසුකම්, නිල ඇඳුම්, පෙළපොත් හා ශිෂ්‍යාධාර පහසුකම් ආදී විවිධාංග ඔස්සේ මෙරට නිදහස් අධ්‍යාපනය උදෙසා රජය විශාල මුදලක් වැයකරයි. මින් ප්‍රයෝජන ලබා විවිධ ක්ෂේත්‍රයන්ගෙන් බිහිවන උගතුන් වැඩි වැටුප් හා වරප්‍රසාද අපේක්ෂාවෙන් විදේශගත වීමේ ප්‍රවණතාවක් මෙකල දැකිය හැකි ය. මොවුන් අතුරෙන් බහුතරයක් ඒ රටවල ම ස්ථිර ව පදිංචි වන බව ද වාර්තා වේ. නිදහස් අධ්‍යාපනයේ ඵල ලබන සියලු දෙනාගේ යුතුකම වන්නේ තම මව්බිමෙහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ය.

(ලකුණු 25)

3) පහත දැක්වෙන පාඨය වචන 40 - 45 ක් වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

දේශනුරාගය යනු තම මාතෘ භූමිය කෙරෙහි ඇති ඇල්මයි. දේශප්‍රේමීත්වයයි, ආදරයයි. එම මාතෘ භූමියෙහි ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ හැඟීම අප සිත්සතන්හි සදා රැඳී පැවතිය යුතුය. දෙපයින් නැඟී සිටිමින් නිදහස් ව, නිවහල් ව, ජීවත් වීමට ඉඩකඩ ලැබෙන්නේ ජාති, ආගම්, කුල භේදවලින් තොර ව එක ම ජාතියක් එනම්, ශ්‍රී ලාංකික යන හැඟීමෙන් යුතු ව කටයුතු කළොත් පමණි. මේ පුණ්‍ය භූමියෙන් මෙලොවට ජනිත වූ අප හැම දෙනාට ම ජීවත් වීමට ප්‍රාණ වායුව ලබා දුන්නේ මේ උතුම් භූමියයි. මිනිසෙකුට තමා උපන් බිමට වඩා වටිනා වෙනත් බිමක් නැත. අභිමානයෙන් යුතු ව ජීවත් වීමට අවශ්‍ය පරිසරය ඒ තුළ පැවතීම ඊට හේතුවකි. දේශානුරාගී හැඟීම් ඔස්සේ තම ජාත භූමිය පිළිබඳ ඇතිවන ආඩම්බරය, අභිමානය, දේශාභිමානයයි. තම ජන්ම භූමිය වෙනුවෙන් දිවි හිමියෙන් කැපවෙමින් මාතෘ භූමියෙහි අනන්‍යතාව, ගෞරවය, අභිමානය සුරකෙන අයුරින් කටයුතු කිරීමත්, මව්බිම වෙනුවෙන් ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීමත් සෑම පුද්ගලයෙකුගේ ම වගකීමකි.

(ලකුණු 10)

4) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති. ඔවුහු අපගේ පිපාසය සන්සිඳුවති. අපගේ ඔරු ද පාරු ද ගෙන යති. අපගේ දරුවන් පෝෂණය කරති. අපි භූමිය ඔබට විකිණුවහොත් මේ ගංගාවන් අපගේත් ඔබගේත් සහෝදරයන් වන බව අමතක නොකරනු මැනවි. ඔබේ දරුවන්ට ද එය කියා දෙනු මැනවි. ගිරි ශිඛරය වසා සිටින හිමිදිරි මීහිදුම, උදාවන හිරු ඉදිරියේ පලා යන්නා සේ සුදු මිනිසාගේ ආක්‍රමණය ඉදිරියේ රතු මිනිසා හැම විට ම පලා ගොස් ඇත. එහෙත් අපගේ පියවරුන්ගේ භෂ්මාවශේෂ අපට පූජනීය භූමි වන්නේ ය. එහෙයින් මේ කඳු තුරුලතා සහ මෙම බිම අපට ම සැප වූ භූමියකි. සුදු මිනිසුන් ඔබ අපගේ සිරිත් විරිත් නොදන්නා බව අපි දනිමු. ඔබට එක් බිම්කඩක් තවත් බිම් කඩකට වඩා වෙනස් නොවේ. රාත්‍රී කාලයේ පැමිණ භූමියේ තිබිය යුතු දේ පැහැර ගෙන පලා යන ඔබගේ මිනිස්සු මේ භූමියට පිටස්තරයෝ වන්නාහ. පොළොව ඔවුනට සහෝදරයෙකු නොව සතුරෙකි.

1) 'ගංගාවෝ අපගේ සොහොයුරෝ වෙති' යන්න සනාථ කරවන කරුණු දෙකක් ලියන්න.
2) ''සුදු මිනිසාගේ ආක්‍රමණය ඉදිරියේ රතු මිනිසා හැම විටම පලායෑම'' යන යෙදුම සඳහා යොදා ඇති උපමාව කුමක් ද?
3) ඔබගේ මිනිස්සු මේ භූමයට කරන හානිය කුමක්ද?
4) පොළොව සතුරෙකු ලෙස සලකන්නේ කවුරුන් ද?
5) පහත පදවල අර්ථ ලියන්න.
   (අ) ගිරි ශිඛරය (ආ) භෂ්මාවශේෂ

5) කැකිරාව - මරදන්කඩවල ප්‍රදේශයේ දිවි නැගුම වැඩ සටහන යටතේ - පලතුරු කල් තබා ගැනීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට තීරණය කර ඇත. මේ මගින් ප්‍රදේශවාසී තරුණ තරුණයින් 200 කට පමණ රැකියා අවස්ථා හිමි වන අතර අලුත් පලතුරු සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට ප්‍රදේශවාසීනට ඉඩ සැලසේ. එසේම නව පලතුරු වගාවන් ආරම්භ කිරීමට පැළ හා උපදෙස් ලබා දීමටත් කටයුතු සලස්වා දී තිබේ.

මෙම කරුණු ඇතුළත් කරමින් වචන 100 කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවි නැගුම ඒකකයේ සංවර්ධන නිලධාරී පියල් වික්‍රමසිංහ ඔබ යැයි සිතන්න.

## නැතහොත්

ගල්නෑව සල්මල් උයන විද්‍යාලයෙහි 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.එම්. සම්මානී දියණිය දිවීමට පැනීමට උපන් හපන්කමක් දක්වූ දියණියකි. ඇය මෙවර කලාප හා පළාත් ක්‍රීඩා තරගාවලියේ මීටර් 200 දිවීමේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගනිමින් පාසලට, ගමට විශිෂ්ට කීර්තියක් අත් කර දී ඇත. ඇයට උපහාර පිදීමේ උත්සවයක් පසුගිය දා කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පැවැත්විණි.

ඉහත කරුණු ඇතුළත් කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු වාර්තාවක් ලියන්න. ඔබ ප්‍රාදේශීය වාර්තාකරු නිමල් ගුණරත්න යැයි සිතන්න.

Set
A 3

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** **தரம் 11**
**First Term Test 2018** **Grade 11**

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** **පැය දෙකයි**
**சிங்களமொழியும் இலக்கியமும் III** **மூன்று மணித்தியாலம்**

**1.** (i) සිට (x) තෙක් සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) ''අමාවතුර'' කෘතියෙහි රචකයාගේ නම ලියන්න.
(ආ) ''අමාවතුර'' කෘතිය සඳහා මුල් කරගත් බුදුගුණය කුමක්ද?

(ii) ''මම එබස් අසා රජකු බොළඳ නියා යයි නින්දා කළෙමි' යි'' කීය.
(අ) මෙය කිනම් අවස්ථාවකදී ප්‍රකාශ කරන ලද්දක් ද?
(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තාගේ නම ලියන්න?

(iii) (අ) හංස සන්දේශය ලියැවුනේ කිනම් යුගයකදීද?
(ආ) එම යුගයෙහි ලියවුණු තවත් සන්දේශයක නම ලියන්න.

(iv) ''මිනිසුන් ඉවුරුවල යන එන අඩි සද්දෙන්
ළය යට සසල බව මින් මතු නොනැගෙද්දෙන්''
(අ) මෙහි ඉතිරි පද දෙක ලියා දක්වන්න.
(ආ) මෙම කවි පෙළෙහි රචකයා නම් කරන්න?

(v) (අ) සද්ධර්මරත්නාවලිය සඳහා මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක්ද?
(ආ) උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව එහි එන කීවෙනි කතා වස්තුව ද?

(vi) (අ) බැද්දේගම කෘතියෙහි පරිවර්තකයාගේ නම ලියන්න.
(ආ) 'වනසරණ' නම් කෘතියට පාදක කරගත් මුල් කෘතියෙහි නම කුමක්ද?

(vii) (අ) ''රාජ කුමරියෝ පළඳති රන් මිණිබරණා'' මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) ''සිංහබාහු'' නාට්‍ය රචකයා ලියූ නවකතා දෙකක නම් ලියන්න.

(viii) ''තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරහයා කියමි''
(අ) මෙය කාගේ ප්‍රකාශයක්ද?
(ආ) ඉහත පාඨය උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක් ද ?

(ix) (අ) එස්.මහින්ද හිමියන් විසින් රචිත ළමා කාව්‍යය නිර්මාණ දෙකක් නම් කරන්න.
(ආ) මහින්ද හිමියන් මුලින් ම පැවිදි වූයේ කිනම් නිකායකද?

(x) (අ) සංයුක්ත නිකායට්ඨ කතාව හැඳින්වෙන වෙනත් නමක් ලියන්න?
(ආ) 'හානා හීයපානා අඬහැරෙන් දැනේ' පැදිපෙළ අයත් වන්නේ කිනම් කාව්‍ය ගණයකට ද?.

(ලකුණු 2 × 10 =20යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. ''කොළ වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු දොරටු අටලු වාසල් බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙනවුත් කොමඩු බානා සේ මහා ජනයාගේ හිස් කපා ගනුව''

අ) මේ පාඨයෙහි ඇතුළත් උපමාවක් ලියන්න.
අ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

ii. ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
ඔය රැකගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

අ) මෙම කවියෙහි අතුළත් රූපක දෙකක් ලියන්න
ආ) කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න

iii. ''සිටුපුත් **යාළුණු** කෙනෙකුන් හා සමග මැස්සක් මත්තේ සිට ආස සිට නටන ඒ විද්දත් දුවගේ **හාවභාව** ලීලා දැක...''
අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න..
ආ) මෙම පාඨයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

iv. අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනි හුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

අ) මෙම කවියෙන් උපුටා ගත හැකි ප්‍රස්තාව පිරුළක් උපුටා දක්වන්න?
ආ) සමස්ත කවියෙහි අර්ථය කෙටියෙන් පහදන්න.

v. '' වහන්සෙ සැවැත් නුවර කෙනෙසි අහර සිඟිනුයෙම් මූඪගර්භ මාගමක දිටිමි''
අ) ඉහත පාඨයෙහි අදහස සරළ බසින් ලියන්න.
ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 4×5= 20යි)

3. i. සිලිඳුගේ චරිතයත්,
ii. පුංචිමැණිකාගේ චරිතයත්,
බැද්දේගම නවකතාව තුළ නිරූපනය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

නැතහොත්,

i. අයහපත් අදූරදර්ශී ගුරුවරයෙකු නිසාවෙන් පුද්ගලයකු විනාශ වන ආකාරයත්
ii. යහපත් දූරදර්ශී ගුරුවරයෙකුගේ ක්‍රියාකලාපයන් මගින් පුද්ගලයෙකුට සෙත සැළසෙන ආකාරයත් .
අඟල්මල් දමනය කතාව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

4. i. වර්තමාන සරල බසත්,
ii. කාව්‍යමය වියත් බසත්,

උපයෝගී කර ගැනීම ගුත්තිල කාව්‍යයෙහි සාර්ථකත්වයට හේතුවී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

නැතහොත්,

i. සරල උපමා ඇසුරෙන් උපදේශයන් ලබා දීමත්,
ii. ගැමි බස් වහර උපයෝගී කරගැනීමත් ,

නිසාවෙන් හානා හීය පානා අඬහැරෙන් දැනේ පද්‍ය පන්තිය සාර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 15යි)

- 5,6,7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

5. කැරගල වැනුම මගින් පැරණි ගම්මානයක තොරතුරු තත්ත්වාකාරයෙන් ගෙනෙන්නට කතුවරයා සමත්වී ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් ගෙනහැර දක්වමින් විමසන්න

(ලකුණු 10යි)

6. සිංහබාහු නාට්‍යයය අඩසියවසක් මුළුල්ලේ ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාරයන් ලබා ගැනීමට හේතු වී ඇත්තේ එහි පවත්නා උසස් නාට්‍ය රසය නිසාවෙනි. උදාහරණ තුනක් ඇසුරෙන් පහදන්න.

(ලකුණු 10යි)

7. 'ගංගාවේ සංගීතය පැදි පෙළ රචනයේ දී පරිසරයේ සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදී භාෂාව භාවිත කිරීමට සමත් ව ඇත. උදාහරණ තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 10යි)